# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1657/4 – 2010 ජූනි 07 වැනි සඳුදා – 2010.06.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/14/25/2006.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කරුණු පිළිබඳව–

එක් පාර්ශ්වයක් වශයෙන්,

ඒ. ජී. පී. ඩී. ඉන්ද්‍රසේකර, නො. ඒ/631, බුද්ධංගල පාර, අම්පාර.

හා

අනෙක් පාර්ශ්වය වශයෙන්,

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු සබඳතා සහ ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍ය, ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14, 1957 අංක 62, 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්,

1A – G 12939 – 365 (2010/06)

අංක 50/20, සුමුදු උයන, පුබුදු මාවත, මත්තෙගොඩ, පොල්ගස්ඕවිට, වී. අයි. ජයසූරිය මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු සබඳතා සහ ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍ය.

2010 ජූනි මස 03 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/14/25/2006.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එක් පාර්ශ්වයක් වශයෙන්,

ඒ. ජී. පී. ඩී. ඉන්ද්‍රසේකර, නො. ඒ/631, බුද්ධංගල පාර, අම්පාර.

හා

අනෙක් පාර්ශ්වය වශයෙන්,

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

**අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ,**

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය යටතේ පාලනය වන අම්පාර ටයර් කම්හලෙහි III–A ශ්‍රේණියේ භාරකාර ඉංජිනේරු වශයෙන් 2004.10.20 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ආවරණ පත්වීමක් ලැබූ, ඒ. ජී. පී. ඩී. ඉන්ද්‍රසේකර මහතාට එම තනතුරෙහි ස්ථිරත්වය ලබා නොදීම හේතුවෙන්, ඔහුට යම් අසාධාරණයක් සිදුවූයේ ද යන්න හා අසාධාරණයක් වූයේ නම්, ඔහුට ලැබිය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව ද වේ.

**ඩබ්ලිව්. ජේ. එල්. යූ. විජයවීර,**
කම්කරු කොමසාරිස්.

2010 මැයි මස 20 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

06 - 475

---

මගේ අංකය: IR/10/41/2009.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කරුණු පිළිබඳව–

එක් පාර්ශ්වයක් වශයෙන්,

ආර්. ගොඩැල්ලවත්ත, ''වින්ධ්‍යා සෙවන'', නො. 124/ඒ, සියත පටුමග, මීගමු පාර, මල්කඩුවාව, කුරුණෑගල

හා

අනෙක් පාර්ශ්වය වශයෙන්,

ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව, අංක 109, රොටුන්ඩා ටවර්, ගාළු පාර, කොළඹ 03.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු සබඳතා සහ ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍ය, ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14, 1957 අංක 62, 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්,

අංක බී 9, මාතා පාර, මැනිං ටවුන් නිවාස යෝජනා ක්‍රමය, කොළඹ 08, එන්. ඒ. ජයවික්‍රම මහත්මිය පත්කර ඇය වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු සබඳතා සහ ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍ය.

2010 මැයි මස 25 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/10/41/2009.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එක් පාර්ශ්වයක් වශයෙන්,

ආර්. ගොඩැල්ලවත්ත, ''වින්ධ්‍යා සෙවන'', නො. 124/ඒ, සියත පටුමග, මීගමු පාර, මල්කඩුවාව, කුරුණෑගල

හා

අනෙක් පාර්ශ්වය වශයෙන්,

ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව, අංක 109, රොටුන්ඩා ටවර්, ගාළු පාර, කොළඹ 03.

අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ,

01. ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ සේවය කරන ආර්. ගොඩැල්ලවත්ත මහතා සම්බන්ධයෙන් ලබා දී ඇති අංක 35/2007 හා 2008.06.23 දිනැති ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගය පරිදි 2008.07.18 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සංස්ථාව විසින් ඔහු නියමිත වැටුප් තලය මත නැවත සේවයේ පිහිටුවා තිබේද යන්න හා නොඑසේ නම්, ආර්. ගොඩැල්ලවත්ත මහතාට හිමිවිය යුතු සහනයන් මොනවාද?

02. ආර්. ගොඩැල්ලවත්ත මහතා 2008.07.18 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත සේවයේ පිහිටුවීම මත එම සංස්ථාව විසින් නිකුත් කරනු ලැබූ අංක 1686 හා 2007.11.06 දිනැති පිරිස් කාර්යාංශ චක්‍රලේඛය පරිදි දහය (10)කට වැඩි කාලසීමාවක් එකම ශ්‍රේණියක සිටින සේවකයෙකු වශයෙන් සලකා උසස්වීම් ලබා ගැනීමට හිමිකම් ඇත්ද යන්න හා නොඑසේ නම්, ඔහුට ලැබිය යුතු සහනයන් මොනවාද යන්න හා,

03. ආර්. ගොඩැල්ලවත්ත මහතා 1986.01.03 දින සිට ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ අවුරුදු විස්ස (20)ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කළ සේවකයෙකු වශයෙන් සලකා ''විසි (20) අවුරුදු සේවා තිළිණය'' සඳහා හිමිකම් ලබන්නේ ද යන්න පිළිබඳව ද වේ.

**ඩබ්ලිව්. ජේ. එල්. යූ. විජයවීර,**
කම්කරු කොමසාරිස්.

2010 මැයි මස 12 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

06 - 476

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.